# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය


**අංක 11,680 — 1959 පෙබරවාරි 27 වැනි සිකුරාද — 27.2.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැළපෙන පරිද්දෙනි)**


| | | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන | ... | ... | 85 |
| තනතුරු-ඇබෑර්තු | ... | ... | 186 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | ... | ... | — |
| අතුරු ව්‍යවස්ථා | ... | ... | 189 |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් | ... | ... | — |

| | | | පිට |
|---|---|---|---|
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ | | ... | — |
| අය වැය ලේඛන | ... | ... | — |
| දේපල විකිණීම | ... | ... | — |
| මාගී කොමිටි දැන්වීම් | ... | ... | — |
| විවිධ දැන්වීම් | ... | ... | 189 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ජී. සී.—බීබී. 435.

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වැනි පරිච්ඡේදය) 22 වැනි වගන්තිය යටතේ ඒ සඳහා නියමිත බල මණ්ඩලය විසින් එනම්, වැලිගම නගරයේ කටයුතු පාලනය කිරීම සඳහා පත් කරන ලද විශේෂ කොමසාරිස්වරයා විසින් සම්පාදිතව, එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් ස්ථිර කරන ලද නියෝගයයි.

#### නියෝගය

1958 වේ ජනවාරි මස 10 වැනි දින අංක 11,236 දරන ගැසට් පත්‍රයේ පළවූ නියෝගයෙන් අවසාන වරට සංශෝධනය කරන ලද, 1935 නොවැම්බර මස 22 වැනි දින අංක 8,175 දරන ගැසට් පත්‍රයේ පළවූ නියෝගය, එහි 10 වැනි නියෝගය අස්කොට ඒ වෙනුවට පහත සඳහන් අළුත් නියෝගය යෙදීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

“10. (1) (අ) මස් පිණිස සතුන් මරණ ස්ථානය පාවිච්චි කිරීම සඳහාත්, (1) වැනි නියෝගයේ සඳහන් ස්ථානයේ පැය 24 කට වැඩි නොවූ කාල සීමාවක් සඳහා ප්‍රසිද්ධියේ නැඹීම සඳහාත් එක් එක් ගවයකුට රුපියල් 4 බැගින් වූද ;

(ආ) මස් පිණිස සතුන් මරණ ස්ථානය පාවිච්චි කිරීම සඳහා එක් එක් බැටළුවකු, එළුවකු හෝ ඌරකුට රුපියල් 2 බැගින් වූද,

ගාස්තුවක් වැලිගම නගරයේ කටයුතු පාලනය කිරීම පිණිස පත් කර සිටින විශේෂ කොමසාරිස්වරයාට හෝ වැලිගම නගරය සඳහා පළාත් ආණ්ඩු සභාවක් සංස්ථාපනය කළවිට, එකී පළාත් ආණ්ඩු සභාවට හෝ කලින් ගෙවියයුතු වන්නේ ය.

(2) 1 වැනි නියෝගයේ සඳහන් ස්ථානයේ පැය 24 කට වැඩි කාල සීමාවක් ප්‍රසිද්ධියේ තබාගන්නා කල්හි, වැඩිපුර පැය 24 ක හෝ ඉන් කොටසක හෝ එක් එක් කාල සීමාව සඳහා එක් එක් ගවයකුට රුපියල් 2 බැගින්වූ අමතර ගාස්තුවක් ගෙවියයුතු වන්නේ ය.”

වි. චා. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යකායඖංශයේ ස්ථාවර ලේකම්තැන.

1959 පෙබරවාරි මස 7 වැනි දින,
කොළඹදීය.

---

### 1946 යේ අංක 57 දරන පළාත් පාලනය (දැන්වීම්) පිළිබඳ ආඥාපනත

මාතලේ, ඉහළ මධ්‍යම කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාවූද, මහනුවර පහළ මධ්‍යම කොට්ඨාශයේ වැඩ බලන පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාවූද, එච්. ඒ. පි. අභයවර්ධන මහතා, ස්වකීය රාජකාර්ය කටයුතුවලට අමතර වශයෙන්, 1959 යේ පෙබරවාරි මස 16 වැනිදා සිට එම මස 21 වැනිදා දක්වාද, 1959 යේ පෙබරවාරි මස 24 වැනිදා සිට එම මස 28 වැනිදා දක්වාද නිවාඩුගෙන සිටින බදුල්ලේ ඌව කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා වෙනුවට වැඩ බැලීම පිණිස රාජ්‍යසේවා කොමිෂන් සභාව විසින් පත් කර තිබේ.

ඊ. ඈෆ්. ඩයස් අබේසිංහ,
පළාත් පාලන කොමසාරිස්.

1959 පෙබරවාරි 24 වැනි දින,
කොළඹ පළාත් පාලන කාර්යාලයේ දීය.

## මාතලේ දිස්ත්‍රික්කයේ කන්ද පල්ල කෝරලේ ගම්කායභා සභාව

### 1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශොධිත ආඥපනත

1951 කේ අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥපනතේ 13 (ඒ) (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අදිකාරී තැනවූද මාතලේ දිස්ත්‍රික්කයේ කන්ද පල්ල කෝරලේ ගම්කායභා සභාවේ සභපාතිවූද, ඊ. ඇම්. බි. රත්නායක වන මම, 1959 වර්‍ශයේ මෙහි පහත සඳහන් කර තිබෙන උපලේඛනයේ දක්වෙන දිනවලදී මාතලේ දිස්ත්‍රික්කයේ කන්ද පල්ල කෝරලේ ගම්කායභා සභා ප්‍රදේශයේ සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම සම්පූර්ණයෙන් ම මෙයින් තහනම් කරමි.

උපලේඛනය

මාර්තු 1, 8, 17, 24, 31.
අප්‍රේල් 7, 16, 22, 29.
මැයි 6, 15, 21, 29.
ජූනි 5, 13, 20, 27.
ජූලි 5, 13, 19, 27.
අගෝස්තු 3, 11, 17, 26.
සැප්තැම්බර් 2, 9, 16, 24.
ඔක්තෝබර් 1, 8, 15, 24, 31.
නොවැම්බර් 7, 14, 23, 29.
දෙසැම්බර් 6, 14, 22, 29.

ඊ. ඇම්. බි. රත්නායක,
කන්ද පල්ල කෝරලේ ගම්කායභා සභාවේ සභාපති තැන.

වර්‍ෂ 1959ක්වූ පෙබරවාරි මස 27 වැනි දින,
ගලේවෙල පිහිටි ගම්සභා කායභාලයේදිය.

---

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිඹුල ගම්කායභා සභාව

### 1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශොධිත ආඥපනත

1951 කේ අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශොධිත ආඥපනතේ 13 (ඒ) (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරිතැනවූද නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිඹුල ගම්කායභා සභාවේ සභාපතිවූ ද. එච්. කේ. මෙන්ඩිස් වන මම, 1959 වර්‍ෂයෙහි මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වෙන පසළොස්වක් පොහොය දිනවලදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිඹුල ගම්කායභා සභා ප්‍රදේශ සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

උපලේඛනය

ජනවාරි 24.
පෙබරවාරි 22.
මාර්තු 24.
අප්‍රියල් 22.
මැයි 21.
ජූනි 20.
ජූලි 19.
අගෝස්තු 17.
සැප්තැම්බර් 16.
ඔක්තෝබර් 15.
නොවැම්බර් 14.
දෙසැම්බර් 14.

එච්. කේ. මෙන්ඩිස්,
දිඹුල ගම්කායභා සභාවේ සභාපති තැන.

වර්‍ෂ 1959ක්වූ පෙබරවාරි මස 18 වැනි දින,
කොටගල පිහිටි දිඹුල ගම්සභා කායභාලයේදිය.

---

# තනතුරු – ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී, ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, 1946 අංක 5 දරන පළාත් පාලන සේවා (සංක්‍රමණ විධිවිධාන) ආඥ පනතින් සංශෝධනය කරන ලද 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥපනතේ විධිවිධාන වලට ද 1945 අංක 43 දරන ආඥපනත පිළිබඳ ව තවදුරටත් කෙරෙන සංශෝධනවලට ද ඒ ආඥපනත යටතේ සාදනු ලබන රෙගුලාසිවලට ද එසේ ම කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලට ද යටත් වන්නේ ය.

3. **සේවයට බාරගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලෙඛනයෙහි සඳහන් තනතුරු ද කලින් කල ඒ උපලෙඛනයට එකතු කරන අනිත් තනතුරු ද, ස්ත්‍රීන් නො වන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා වල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේ දී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1949 අංක 8 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරු කරනු ලැබූ දිනයට ඉස්සරින් දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින් දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3 ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුදලින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකි ය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනට ම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට, දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම වර්ෂයක ආධුනික කාලයකට හෝ වර්ෂයකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් විසින් ස්වකීය වයස තහවුරු කිරීම පිණිස උප්පැන්න සහතික පිටපත් අමුණා එවිය යුතුයි. දිවුරුම් පෙත්සම් නො පිළිගනු ලැබේ. උප්පැන්න සහතික පිටපත් අමුණා නැති කල්හි අයදුම්කරුවෝ සුදුසුකම් නැත්තවුන් ලෙස සලකනු ලැබෙති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකික යකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම් සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූ වෙකි.

5. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම ආකාරයකින් ම සුදුසුකම් ලැබ සිටින මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අයට ද, සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වුවන් හැර සෑම කෙනෙකුටම ද, ඔව්හු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස, නො කඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඇතින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දිනත්, ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයේ යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

7. ප්‍රසිද්ධ කොට ඇති තනතුරෙහි පන්තියට හා ශ්‍රේණියට ම අයත් වන තනතුරු උසුලන පළාත් පාලන සේවා සාමාජිකයන්ට අධ්‍යාපන සුදුසුකම් නො තකා, පළ කොට ඇති ඇබෑර්තුවට මාරු වී යාම සඳහා අයදුම් පත් එවිය හැකි ය.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් තම තමන් සේවය කරන ප්‍රාදේශික බලමණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරු වලින් මුදාහරින්ට තමන් සූදානම් ව සිටින් ද නැද්දැයි සඳහන් කළ යුතු යි.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයන් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iv) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම් පත් වනාහි මීට යා කොට ඇති ආකෘතියට සෑරුනුකූලව පිළියෙළ කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පතේ ආකෘතිය

### පළාත් පාලන සේවය

..................................තනතුර සඳහා වූ අයදුම්පත යි

(1) දැන්වීමේ සම්බන්ධය :————.

(2) සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

ජාතිය :————.

(ඉහත සඳහන් 4 වැනි කොන්දේසියේ අර්ථ නිරූපණය අනුව ලාංකිකයෙක් ද නැද්ද යනු සඳහන් කරනු)

(3) සම්පූර්ණ තැපැල් ලිපිනය :————.

(4) වයස හා උපන් දිනය :————.

(5) උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

(6) විවාහක ද අවිවාහක ද ? :————.

(7) අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය (දිනයත් සමඟ)—

(අ) ඉංග්‍රීසි :————.

(ආ) සිංහල/දෙමළ :————.

(8) ඉගෙන ගත් පාඨශාලාව සහ පාඨශාලාවෙන් අස්වූ දිනය : ————.

(9) (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා :————. (දිනයන් හා සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර ද සඳහන් කළ යුතුය.)

(ආ) මීට කලින් ආණ්ඩුව යටතේ සේවය කෙළේ නම් සේවය නතර කිරීමේ හේතුවත් සමඟ සේවය පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

(ඇ) පළාත් පාලන සේවා සාමාජිකයෙක් නම්—

(i) දැනට දරන තනතුරේ නම සහ ශ්‍රේණිය :————.

(ii) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) පළාත් පාලන මණ්ඩලවල සේවය පිළිබඳ වාර්තා සටහන :————.

(ඈ) සේවා මුක්ත භටයෙක් නම්—
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුණ දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

(10) සිංහල හා දෙමළ යන භාෂා කියවීම, ලිවීම හා භාෂණ පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාව :————.

(11) විශේෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————. (වෘත්තිය හා ශිල්පීය සුදුසුකම් ආදිය මෙනි)

(12) විශේෂ හිමිකම් ආදියක් ඇතොත් ඒ පිළිබඳ විස්තර : ————.

(අයදුම්කරු ඉල්ලුම්කර සිටින තනතුර වැනි තනතුරක සේවය කිරීමෙන් ලබා ඇති පළපුරුද්ද මෙනි)

(13) තෝරා ගනු ලැබුවහොත්, බලාපොරොත්තු වන වැටුප : ————.

(14) චරිත සහතික ලබා ගෙන ඇති පුද්ගලයන්ගේ නම් සහ පදවි නාම :————.

(ඒ සහතිකවල මුල් ලිපි නොව ඒවායේ පිටපත් පමණක් ඇමිණිය යුතුයි)

(15) පළාත් පාලන සේවය යටතේ සේවය කෙළේ ද, එසේ නම් කිසියම් අවස්ථාවක සේවය නතර කරනු ලැබුවේද ? ————.

(16) කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

(17) ණයතුරුස් වලින් හෝ මුදල් කරදර වලින් නිදහස් ද : ————.

(18) ප්‍රධාන මුලාදෑනියාගෙන් හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරියාගෙන් හෝ සමාදාන විනිශ්චයකාරයකුගෙන් හෝ දේවගැතිවරයකුගෙන් හෝ ලබාගත් පදිංචිය පිළිබඳ සහතික (පදිංචිය පිළිබඳ සහතිකයක් අවශ්‍ය වන අවස්ථාවල දී) : ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## පළාත් පාලන සේවය

### පළාත් පාලන සේවා ගබඩා භාරකරු සේවය

පළාත් පාලන සේවා ගබඩා භාරකරු සේවයේ දෙවැනි ශ්‍රේණියට අයත් ගබඩා භාරකරු තනතුරක් සඳහා, පළාත් පාලන සේවා කොමිෂන් සභාව මගින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. තෝරාගනු ලැබූ අයදුම්කරු පළමුවැනි වරට මොරටුව පළාත් ආණ්ඩු සභාවට පත්කරනු ලැබෙයි.

2. **වැටුප් ක්‍රමය :**—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප් රුපියල් 960න් පටන් ගෙන, වර්ෂයකට රුපියල් 72 බැගින් 24 වරක් වැඩිවී රුපියල් 2,688 තෙක් නගී. එහි රුපියල් 1,608 සහ රුපියල් 2,184 යන මේ වාර්ෂික වැටුප් වලට ප්‍රථමයෙන් කාර්යක්‍ෂමතා කඩඉම් ඇත්තේය.

3. **අවශ්‍ය සුදුසුකම් :**—

(අ) වයස :—1959 මාර්තු මස 17 දිනට වයස අවුරුදු 22ට නොඅඩු අවුරුදු 35ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන්ට ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන සහතික පත්‍රයක් හෝ ඊට උසස් සහතික පත්‍රයක් හෝ තිබිය යුතුයි. එසේම ගබඩා භාරකරු කටයුතු, ගබඩා ගණන් තැබීම් හා සාමාන්‍ය කාර්යාලයීය කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුයි.

(ඇ) අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා නැති සියලුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ. දිව්රුම් පෙත්සම් පිළිගනු නොලැබේ.

4. තෝරාගනු ලැබූ අයදුම්කරුට මුදල් මගින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කොට ඇති ඇපකාර සමාගමක් මගින් හෝ රුපියල් 4,000ක ඇපයක් තැබීමට නියම කරනු ලැබෙයි.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1959 මාර්තු මස 17 දිනට හෝ ඊට පළමු මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි 12 වැනි ශීර්ෂය යටතේ සඳහන් කරුණු වෙනුවට පහත සඳහන් කරුණු යොදා ගත යුතුයි :—

"12. පහත සඳහන් දේ ගැන පළපුරුද්ද පිළිබඳ විස්තර :—

(අ) ගබඩා තැබීම ;

(ආ) ගබඩා ගණන් තැබීම ;

(ඇ) සාමාන්‍ය කාර්යාලයීය කටයුතු.

ඒ සනාථ කිරීම සඳහා අවශ්‍ය සහතිකවල පිටපත් එවිය යුතුයි".

7. සියලුම ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවෙකුගේ ඉල්ලුම්පත්‍රය, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුළත ලැබුනු බව දන්වා එවනු නොලැබුවහොත් වහාම ඒ බව පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත දැන්විය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම් පත්‍රය සළකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙයි නම් එය නැති වන්නේය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1959 පෙබරවාරි මස 23 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

---

## පළාත් පාලන සේවය

### කොළඹ නගර සභාවේ මහජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නාගරික ක්‍ෂුද්‍රජීව විද්‍යා රසායනාගාරයේ දෙවැනි ශ්‍රේණියට අයත් රසායනාගාර කාර්මික ශිල්පී තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් ස්ත්‍රී පුරුෂ අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය :**—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 1,020න් පටන්ගෙන වර්ෂයකට රු. 120 බැගින් 15 වරක් වැඩිවී රු. 2,820 දක්වා නගී. එහි වර්ෂයකට රු. 1,500 හා රු. 2,220ට ප්‍රථමයෙන් කාර්යක්‍ෂමතා කඩඉම් ඇත්තේය. තෝරාගනු ලැබූ අයදුම්කරු සවකීය සුදුසුකම් හා පළපුරුද්දට අනුව වැටුප් ක්‍රමයෙහි වැටුප් පෙත්තක් මතට පමුණුවනු ලැබෙයි. විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් පවරාදීමට භාණ්ඩාගාරය එකඟ වුවහොත් ඒ අයිතිවාසිකම් ආරම්භ කරනු ලබනවා ඇත.

3. තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ස්ත්‍රියක් වන අයදුම් කරුවකු තෝරාගනු ලැබුවහොත් අර්ථසාධක අරමුදලට දායිකාවක් වශයෙන් පත් කරනු ලැබෙයි. පත්වීම දෙවර්ෂයක ආධුනික කාලයට හෝ වැඩ පරීක්‍ෂාවට යටත්ය.

4. තෝරාගනු ලැබූ අයදුම්කරු, ඒ වනවිට පුහුණුව ලබා ඇත්නම්, කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ මාස 8ක පමණ පුහුණුවක් ලැබීමටත්, පුහුණුව ලැබූ දින සිට අවුරුදු 3ක කාල පරිච්ඡේදයක් පළාත් පාලන සේවයෙහි සේවය කරන බවට ගිවිසුමකට බැඳීමටත් නියම කරනු ලැබේ. අයදුම්කරු පුහුණුවී අවසානයෙහි ඇති පරීක්ෂණ යෙන් අසමත් වුවහොත්, ඔහුගේ සේවය නතර කළ හැකිය.

5. **අවශ්‍ය සුදුසුකම් :**—අයදුම්කරුවෝ රසායන විද්‍යාව හා පහත සඳහන් වන විෂයයන්ගෙන් එකක් සමඟ ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට ඉහළ විභාගයකින් සමත් වී සිටිය යුතුයි. භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව, පිළිගත් රසායනාගාරයක පුහුණුව හා පළපුරුද්ද ලබා ඇති අයදුම් කරුවන් ගැන විශේෂයෙන් සලකනු ලැබේ.

6. ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්, පළාත් පාලන සේවයෙහි හා රජයේ සේවයෙහි තුන් අවුරුද්දක සතුටුදායක සේවාකාලය සම්පූර්ණ කර ඇති රසායනාගාර කාර්මික ශිල්පීන්ගෙන් හා උප රසායනාගාර සහකාර නිලධාරීන්ගේ ඉල්ලුම් පත්‍රද භාරගනු ලැබේ.

7. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

8. ඉල්ලුම්පත්‍ර, පත්වීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි සාරානුකූලව පිළියෙල කොට 1959 මාර්තු මස 14 දිනට හෝ ඊට පළමු මට ලැබෙන්නට එවිය යුතුයි. පූර්වෝක්ත ආකෘති පත්‍රයෙහි සඳහන් ශීර්ෂයන් යටතේ දැක්වෙන කරුණු වෙනුවට පහත සඳහන් කොට ඇති කරුණු යෙදගත යුතුයි:—

"7. අධ්‍යාපන සුදුසුකම් සහ අන්තිමට සමත් වූ විභාගයේ නම, සමත් වූ විෂයයන් සඳහන් කරන්න. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම පිළිබඳ සහතිකයේ පිටපත් ඇමිණිය යුතුයි.

9. (සී) පළාත් පාලන ආයතනයන්හි සේවය පිළිබඳ සටහන— දැරූ තනතුරු පිළිබඳ විස්තර හා ඒවා දැරූ කාල සීමාවන් සඳහන් කරන්න :————.

(බී) දැනට කරන රක්‍ෂාව :————.

(i) දැනට කරන තනතුරේ පදවි නාමය හා ශ්‍රේණිය, ඒ තනතුරට පත් වූ දිනය :————.

(ii) වැටුප් විස්තර:—

(අ) වැටුප් ක්‍රමය :————.

(ආ) දැනට ලබන වැටුප :————.

11. විශේෂ පුහුණුවක්, සුදුසුකම් හෝ පළපුරුද්දක් වෙයිනම් ඒ පිළිබඳ විස්තර :————.

12. රසායනාගාර වැඩ පිළිබඳ පළපුරුද්ද :————."

9. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුළත සවකීය ඉල්ලුම් පත්‍රය ලැබුණු බව දන්වා එවනු නොලැබුවහොත් ඒ බව වහාම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත දන්වා එවිය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් තම ඉල්ලුම්පත්‍රය සලකා බැලීම සඳහා කිසියම් හිමිකමක් වෙයි නම් එය නැති වී යන්නේය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1959 පෙබරවාරි 21 දින,
තැ. පෙ. 530,
කොළඹ.

## පළාත් පාලන සේවය

### පළාත් පාලන සේවයේ වින්නඹු සේවිකා තනතුරු දෙකක්

පළාත් පාලන සේවා වින්නඹු සේවිකා සේවයේ තනතුරු 2 ක් සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. තෝරාගනු ලැබූ අයදුම්කරුවෝ ගාල්ල නගර සභාවට පත් කරනු ලැබෙති.

2. **වැටුප් ක්‍රමය** :—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රුපියල් 666න් පටන්ගෙන වර්ෂයකට රුපියල් 72 බැගින් 15 වරක් වැඩි වී රුපියල් 1,296 දක්වා නගී. එහි රුපියල් 1,086 වාර්ෂික වැටුපට ප්‍රථමයෙන් කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **අවශ්‍ය සුදුසුකම්** :—

(අ) වයස :—59.3.11 වැනි දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුයි.

(ආ) ඉල්ලුම්කාරියෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතුමාගෙන් ප්‍රවීණතාව පිළිබඳ සහතිකයන් දරන, ලියාපදිංචි වූ වින්නඹු සේවිකාවෝ විය යුත්තාහ. සෞඛ්‍ය මණ්ඩල වැඩ ගැන පළපුරුද්දක් ඇති, සිංහල හා දෙමළ කථා කළ හැකි අය ගැන විශේෂ සැළකිල්ල දක්වනු ලැබේ.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටස් ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1959.3.11 දින හෝ ඊට පළමු මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘති පත්‍රයෙහි 19 වැනි ශීර්ෂය අත්හැරිය හැකිය.

6. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවකුගේ ඉල්ලුම්පත්‍රය, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු නොලැබුව හොත් වහාම ඒ බව පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් තුමා වෙත දැන්විය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම් පත්‍රය සලකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙසි නම් එය නැති වන්නේ ය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1959 පෙබරවාරි 21 වැනිද,
තැ. පෙ. 530,
කොළඹ.

---

# අතුරු ව්‍යවස්ථා

ඇල් ඞී—ඞී 46/54/ඇල්. ජී. ඞී—ජීඒ 11/29/2

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මැදසිය පත්තුවේ ගම්ප්‍රදේශයේ ගම්කායඞ සභාව විසින් සම්පාදිතව 1947 සැප්තම්බර් 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පලවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරන ලද එකී වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යකායඞාංශයේ ස්ථාවර ලේකම්.

1959 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාවයි

### කැලිකසල ඉවත්කිරීම පිළිබඳ ගාස්තු

1. (1) කායඞ සභාව විසින් සම්මත කරගන්නා ලද පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල 6 වැනි කාණ්ඩයේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවෙහිවූ කාරණා සඳහා කායඞ සභාවට ගෙවියයුතු කැලිකසල ඉවත්කිරීමේ මාසික ගාස්තුව රුපියල් එක (රු.1) බැගින් විය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ "කායඞ සභාව" යනුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මැදසිය පත්තු ගම් ප්‍රදේශයේ ගම්කායඞ සභාව අදහස් කරනු ලැබේ.

# විවිධ දැන්වීම්

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959යේ වෂියට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරිමට විරුද්ධව පොලොන්නරු දිස්ත්‍රික්කයේ සිංහලපත්තු ගම්කායඞ සභා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුන නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට 14 දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත යටතේ 201 වැනි පරිච්ජේදයේ අංක 7 දරන 1947තේ අංක 44 දරන ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරන ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

එච්. ඇම්. විලියම බණ්ඩාර,
සිංහලපත්තු ගම්කායඞ සභාවේ
සභාපති තැන.

ගම්සභා කාර්යාලය,
මින්නේරිය.
8.12.1958

### උපලේඛනය

(1) ඉල්ලුම්කරුගේ නම: ඇල්. සයිමන්; ස්ථානය හිඟුරක්ගොඩ මාර්කට් භූමිය ; වෙළදාම : එළුමස්, ඌරුමස්.

(2) ඉල්ලුම්කරුගේ නම: එච්. ඇස්. මොහිදීන්; ස්ථානය හිඟුරක්ගොඩ මාර්කට් භූමිය ; වෙළදාම : එළුමස්.



ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.